**සීමාසහිත ත්‍රිකුණාමළ විදුලිබල සමාගම -2019/ 2020 මාර්තු**
------------------------------------------------------------------------------

**1.1 මතය**
------

සීමාසහිත ත්‍රිකුණාමළ විදුලිබල සමාගමෙහි ("සමාගම") 2020 මාර්තු 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීරණ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2020 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.
මෙම විගණනය සඳහා ප්‍රසිද්ධ වෘත්තියෙහි යෙදී සිටින වරලත් ගණකාධිකාරී සමාගමක සහය මා ලබාගන්නා ලදී.

මූල්‍ය ප්‍රකාශන වලින්, 2020 මාර්තු 31 දිනට සමාගමේ මූල්‍ය තත්ත්වය හා එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.2 මතය සඳහා පදනම**
------------------------

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3 අඛණ්ඩ පැවැත්ම සම්බන්ධයෙන් වූ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවය**
------------------------------------------------------------------

මාගේ මතය තත්වාගණනය නොකර, මූල්‍ය ප්‍රකාශනවල අංක 2.1.5 සටහන වෙත අවධානය යොමු කරමි, එමඟින් අවිනිශ්චිතතාවයක් විස්තර කෙරෙන අතර සමාගමට අඛණ්ඩව පවත්වාගෙන යාමට ඇති හැකියාව පිළිබඳව සැකයක් පහළ කරයි.

**1.4 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාර්ශවයන්ගේ වගකීම්**
------------------------------------------------------------------------------------------------

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සත්‍ය හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය යැයි කළමනාකරණය තීරණය කරනු ලබන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කිරීම, සමාගම අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය සමාගම ඈවර කිරීමට අදහස්කරන්නේ නම්හෝවෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම නැවැත්වීමටකටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හාසමාගමේ අඛණ්ඩ පැවැත්මට අදාළකරුණු අනාවරණය කිරීම ද කළමනාකරණයේ වගකීමකි.

සමාගමේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය හා සම්බන්ධ පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව සමාගම විසින් සමාගමේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යාම අවශ්‍ය කෙරේ.

## 1.5 විගණන විෂය පථය

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක අවප්‍රකාශයන්ගෙන් තොර බවට තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් ඇති විය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ආර්ථික තීරණ ගැනීමේදී ඒ පිළිබඳව සැලැකිළිමත් විය යුතුය.

වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදී. මා විසින්,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කිරීමෙන් වංචා සහ වැරදි හේතුවෙන් ඇතිවන්නා වූ අවදානම් මඟ හරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබා ගැනීම මාගේ මතයට පදනම් වේ. ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන අතර, දූස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මඟහැරීම, හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.

- අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස සමාගමේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබා ගන්නා ලද නමුත්, අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- කළමණාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය සහ යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල හා සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල සාධාරණත්වය ඇගයීම.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් සමාගමේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාළත්වය තීරණය කරණ ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම්වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමුකළයුතු අතර, එම හෙළිදරව් කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතු වේ. මාගේ නිගමනයන් විගණකගේ වාර්තාවේ දිනය දක්වා ලබාගන්නා ලද විගණන සාක්ෂි මත පදනම් වේ. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත සමාගමේ අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථය ද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ සමාගමේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පටිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව එකී පද්ධති, පටිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේද යන බව,

- යම් අදාල ලිඛිත නීතියකට හෝ සමාගමේ පාලක මණ්ඩලය විසින් නිකුත්කරණ ලද වෙනත් පොදු හෝ විශේෂ විධිවිධානයකට අනුකූලව, සමාගම ක්‍රියාකර ඇති බව.

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව සමාගම කටයුතු කර ඇති බව,

- සමාගමේ සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවක් තුල සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

## 1.6 මූල්‍ය ප්‍රකාශන

### 1.6.1 ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන්ට අනුකූල නොවීම

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සාම්පූර් හි අක්කර 505 ක පමණ ඉඩමක මෙගාවොට් 2x250 ගල් අඟුරු බලාගාරයක් සහ ඒ ආශ්‍රිත අතිරේක පහසුකම් සංවර්ධනය කිරීමට වසර 40 ක කල්බදු කාලයක් සඳහා සමාගම ශ්‍රී ලංකා රජය සමඟ ඉඩම් කල්බදු ගිවිසුමක් අත්සන් කර ඇති බව අපි නිරීක්ෂණය කළෙමු. ඉඩම් කල්බදු ගිවිසුමට අනුව, වර්ෂයකට රු.504,982 ක් සමාගම විසින් ගෙවිය යුතු අතර එස්එල්එෆ්ආර්එස් 16 -කල්බදු ප්‍රමිතය අනුව "භාවිත කිරීමේ අයිතිය" සමාගම විසින් මුල් වරට හඳුනාගෙන නොමැත. | ඔබේ නිර්දේශය සමඟ එකඟ වන්නෙමු. කෙසේ වෙතත් මෙගාවොට් 50 ක සූර්යබල ව්‍යාපෘතිය තවමත් ආරම්භ කර නොමැති අතර ඉදිරි මූල්‍ය වර්ෂයේදී අපි මෙය සලකා බලන්නෙමු. | මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී සහ ඉදිරිපත් කිරීමේදී ගිණුම්කරණ ප්‍රමිතීන්හි විධිවිධාන යෙදිය යුතු අතර, එම කාල සීමාව සඳහා සමාගමේ මූල්‍ය තත්ත්වය සහ කාර්යසාධනය සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම, සහතික කිරීම සඳහා කළමනාකාරිත්වය විසින් නිසි සැලකිල්ලක් දැක්විය යුතුය. |

### 1.6.2 විගණනය සඳහා ලබා දී නොමැති වාර්තාමය සාක්ෂි

| | අයිතමය | වටිනාකම රු. | සාක්ෂි නොමැත | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|---|
| (අ) | ඉඩම් හා සංවර්ධන වත්කම් කපා හැරීම් | 2,985,550 | කොන්ත්‍රාත්කරු පිළිගැනීම සහ මණ්ඩලයේ යෝජනාව | මෙම කපා හැරීම සිදුවන්නේ රුහුනු සංවර්ධකයින්ට ගෙවන ලද කොන්ත්‍රාත් වටිනාකම අඩු කිරීම හේතුවෙනි. එකඟ වූ ප්‍රමාණයට වඩා අඩු වටිනාකමක් ගෙවමින් දම්වැල් සම්බන්ධක වැට ඉදිකිරීම් කොන්ත්‍රාත්තුව අවසන් කිරීමට | මූල්‍ය ප්‍රකාශන පිළිබඳව සහතිකයක් ලබා ගැනීම සඳහා සුදුසු විගණන සාක්ෂි සැපයිය යුතු අතර ක්‍රියාවලීන් මත ක්‍රියාත්මක කරන ලද පාලනයන් නිසි ලෙස ක්‍රියාත්මක කිරීම සහතික කිරීම සඳහා කළමනාකාරිත්වය විසින් නිසි සැලකිල්ලක් දැක්විය යුතුය. |

| | | | | | |
|---|---|---|---|---|---|
| | | | | අධ්‍යක්ෂ මණ්ඩලය තීරණය කළ හෙයින්, අපි මුල් කොන්ත්‍රාත් වටිනාකමෙන් අඩු කළ මුදල ප්‍රතිවර්තනය කර ඇත්තෙමු. | |
| (ආ) | එන්ටීපීසී උපදේශන පැවරුමෙන් ලැබිය යුතු අත්තිකාරම් | **3,241,657** | මුල් උපකාරක ලියකියවිලි හෝ තහවුරු කිරීම. | ඉන්දියාවේ **COVID-19** සඳහා අගුළු දැමීම හේතුවෙන් එන්ටීපීසී වෙතින් තහවුරු කිරීමක් නොලැබුණි. කෙසේ වෙතත් මේ වන විට අපට මෙම මුදල් සීමාසහිත ත්‍රිකුණාමළ විදුලිබල සමාගමේ ගිණුම වෙත ලැබී ඇත. | මෙම අත්තිකාරම් ගෙවීම් සහ ඒවා අයකර ගැනීමේ හැකියාව සමාලෝචනය කිරීමට කළමනාකාරිත්වය පියවර ගත යුතුය. |
| (ඇ) | බැංකු තැන්පතු | **10,000,000** | කෙටිකාලීන බැංකු තැන්පතු අළුත් කිරීමේ දැන්වීම් | සාමාන්‍යයෙන් අළුත් කිරීමේ දැන්වීම් ලැබෙන්නේ තැපැල් මඟින් වන අතර සමහර තැපැල් ගැටළු හේතුවෙන් අපට එය නොලැබුණි. | කෙටිකාලීන බැංකු තැන්පතුවලට අදාළ උපකාරක ලියකියවිලි සංවිධානාත්මකව පවත්වාගෙන යාමට පියවර ගත යුතු අතර විගණන විමර්ශනය සඳහා ඒවා සැපයිය යුතුය. |

**2.** මූල්‍ය සමාලෝචනය

**2.1** මූල්‍ය ප්‍රතිඵල

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු.**13,475,234** ක බදු පෙර ශුද්ධ අලාභයක් වූ අතර ඊට අනුරූපීව පසුගිය වර්ෂයේ බදු පෙර ශුද්ධ අලාභය රු.**14,839,412** ක් විය. එබැවින්, මූල්‍ය ප්‍රතිඵලයේ රු.**1,364,178** ක අලාභයේ අඩුවීමක් නිරීක්ෂණය විය. පරිපාලන වියදම් රු.**2,362,474** කින් අඩු වීම මෙම ප්‍රතිඵලයට ප්‍රධාන හේතුව විය.

**3.** මෙහෙයුම් සමාලෝචනය

**3.1** ව්‍යාපෘති හෝ ප්‍රාග්ධන වැඩ ප්‍රමාද වීම

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සීමාසහිත ත්‍රිකුණාමළ විදුලිබල සමාගම විසින් සාම්පූර් හි මෙගාවොට් **50** ක සූර්ය බලශක්ති බලාගාරයක් පිහිටුවීමට කැබිනට් අනුමැතිය ලැබී තිබුණද, **JVSHA** සහ ව්‍යාපෘති ගිවිසුම් අත්සන් කර | කළමනාකරණයේ අදහස් දැක්වීම් ලැබී නොමැත. | කැබිනට් තීරණය ක්‍රියාත්මක කිරීම සඳහා වගකිවයුතු පාර්ශවයන් පියවර ගත යුතුය. |

නොමැති අතර වාර්තාවේ දිනය වන විටත් ඉහත බලාගාරයේ කිසිදු සංවර්ධන කටයුත්තක් සිදු කර නොතිබුණි.

**3.2** මානව සම්පත් කළමනාකරණය

වර්ෂය අවසාන වන විට කිසිදු මෙහෙයුමක් නොමැති බැවින් සමාගම අභ්‍යන්තරව කාර්යමණ්ඩලය බඳවාගෙන නොතිබුණි.

**4.** ගිණුම්කටයුතුභාවය සහ යහපාලනය

**4.1** වාර්ෂික වාර්තා සභාගත කිරීම

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2003 ජුනි 02 දිනැති රාජ්‍ය ව්‍යවසාය චක්‍රලේඛ අංක පීඊඩී/12 අනුව 2016/2017, 2017/2018 සහ 2018/2019 සහ 2019/2020 සඳහා වාර්ෂික වාර්තා පාර්ලිමේන්තුවේ සභාගත කර නොතිබුණි. | කළමනාකරණයේ අදහස් දැක්වීම් ලැබී නොමැත. | චක්‍රලේඛ අවශ්‍යතාවය අනුව වාර්ෂික වාර්තා පාර්ලිමේන්තුවේ සභාගත කිරීමට පියවර ගත යුතුය. |

**4.2** සංයුක්ත සැලැස්ම සහ වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2003 ජුනි 02 දිනැති රාජ්‍ය ව්‍යවසාය චක්‍රලේඛ අංක පීඊඩී/12 අනුව සමාගම විසින් සංයුක්ත සැලැස්මක් සහ වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මක් සකස් කර නොතිබුණි. | කළමනාකරණයේ අදහස් දැක්වීම් ලැබී නොමැත. | චක්‍රලේඛ අවශ්‍යතාවය පරිදි ව්‍යාපෘති ක්‍රියාකාරකම් සැකසීමට සහ සංයුක්ත සැලැස්ම හා වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම සකස් කිරීම සඳහා සමාගමේ කළමනාකාරිත්වය වහාම පියවර ගත යුතුය. |

**4.3** අයවැයමය පාලනය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂය සඳහා වාර්ෂික අයවැයක් සකස් කර නොතිබුණි. | කළමනාකරණයේ අදහස් දැක්වීම් ලැබී නොමැත. | අනාගතයේදී සමාගම සඳහා වාර්ෂික අයවැය සකස් කිරීමට සමාගමේ කළමනාකාරිත්වය පියවර ගත යුතුය. |